


# මී මැස්සා සහ පාට නැති මල

ඊ. ඒම්. ඒ. ජී. හිමාෂා සඳමිණී ඒකනායක

# මී මැස්සා සහ පාට නැති මල

ඊ. ඒම්. ඒ. ජී. හිමාෂා සඳමිණි ඒකනායක

කතෘගේ වෙනත් කෘති

- අතරමං වු බූලා 2023
- පැණි කුරුල්ලා 2024

මහ/මහාමායා බාලිකා විදුහල

5 A

2026.04.17

ISBN 978-624-211-106-3

# පිදුම

ආදරණීය දෙමාපියන්ටත්

අකුරු කරවූ

සියළු ගුරු මෑණිවරුන්ට

මෙය

පූජෝපහාරයක් වේවා.......



## පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

ඔන්න ඉතින් ලස්සනම ලස්සන ගම්මානයක පුංචි මී මැස්සෙක් හිටියා. එයාගේ නම බින්දු. ඉතින් මේ බිංදු හැමදාම උදේට වටපිටාවේ ඇවිදින්න ගිහිල්ලා බොහෝම සතුටින් මල් පැණි බීලා ඉන්න කෙනෙක්.



ඉතින් ඔන්න මේ බිංදුවට ගොඩාක් මල් යාලුවෝ හිටියා. ඒ වගේම සමනල්ලු තවත් මී මැස්සෝ පැණි කුරුල්ලෝ ආදී ගොඩාක් යාළුවෝ බිංදුත් එක්ක සතුටින් හැමදාම වගේ සෙල්ලම් කරනවා.



පුංචි මලියි කියලා ලස්සනම ලස්සන ගැහැණු ළමයෙක්ට ලස්සනම ලස්සන මල් උයනක් තිබුණා. ඉතින් මේ මලී මල් උයනට සාත්තු කරනවා. එය ලස්සන කරන්න මලී හරිම කැමැතියි. ඒ නිසා මලීගේ මල්

උයනට සමනල්ලු මීමැස්සෝ පැණිකුරුල්ලෝ ආදී සතුන් බොහොමයක් මල් උයනට හැමදාම එනවා.




බින්දුත් මලිගේ මල් වත්තට යන්න හරිම කැමතියි. ඉතින් යාළුවේ දවසක් බිංදු මලීගේ මල් වත්තේ පැණි බොන්න ගියා. මලින් මලට බින්දු මල් උයනේ පියඹුවා.

බින්දු දැක්කා මලිගේ මල් උයනේ එක තැනක ගොඩක් දුකෙන් හුදකලාවට පත්ව සිටි කඩදාසියක් වගේ මොනවදෝ තියෙනවා.



ඉතින් මේ බිංදු හෙමින් හෙමින් ඒ පැත්තට ළං උනා හරි පුදුමයි. ඒ මල ඉතින් මේ බිංදු හෙමින් හෙමින් ඒ පැත්තට ලං වුණා. හරි පුදුමයි. ඒ මලක් ඒ පුංචි මල අඬ අඬා තමා හිටියේ.

ඉතින් මේ බිංදු ඇයි යාළුවේ කියා ඇසුවා. ඊට පස්සේ කඩදාසි මල කිව්වා බලන්න යාළුවේ අනිත් මල් දිහා අනිත් යාලුවෝ ළගට සමනල්ලු මීමැස්සො පැණිකුරුලු ආදී සතුන් ගොඩක් එනවා. මං ගාවට කවුරුවත්ම එන්නේ නැහැ. ඒ නිසා තමයි මම ගොඩක් දුකින් ඉන්නේ කියලා කිව්වා.



බින්දුගේ ඇස්වලට කඳුළු ගොඩක් පිරුණා. පාට නැති මල බිංදුට කිව්වා. මට උදව් කරන්න පුළුවන්ද කියලා. ඉතින් මේ බිංදු කිව්වා හා කියලා. මොකක්ද ඇහුවා ඉතින් කඩදාසි මල කිව්වා මටත් අනිත් මල් වගේ වෙන්න ඕන කියලා. ඉතින් මේ බිංදු ඒ තීරණයට එකඟ වුණා.



බින්දුව ඊට පස්සේ මල් යාළුවන්ට ඒ විස්තර කියනවා අපි එයාට උදව් කරමු කියල බිංදු කිව්වා. මල් යාලුවෝ ඔක්කොම ඒ තීරණයට කැමති වෙනවා ඊට පස්සේ හැම මලකින්ම ටික ටික පාට දෙනවා.



බින්දු ඒ පාට එකතු කරලා මුළු උයනේම ඇවිදලා පාට ගොඩක් එකතු කරගෙන එනවා  දැකලා මලට ගොඩක් සතුටු හිතුනා.



බින්දු පාට ටික එකතු කරලා කඩදාසි මලේ තවරනවා ඉතින් මේ කඩදාසි මලට හරි සතුටුයි. දැන් කඩදාසි මලේ නම ඩේලියා. ඩේලියා මලෙන් පැණි බොන්න මී මැස්සෝ ආදි සත්තු ගොඩාක් ආවා. ඩේලියා මලත් එක්කත් යාළු වුණා.





# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නුතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දූරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැකවීම ද මෙහි මුලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමතුමන් ඇතුලූ ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්

( ව්‍යාපෘති නිර්මාතෘ)